# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2291/43 - 2022 අගෝස්තු මස 05 වැනි සිකුරාදා - 2022.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.සී.එෆ් 1/64

### (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදය සමග කියවිය යුතු, (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
ජනාධිපති.

2022 අගෝස්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

අංක 2289/41 සහ 2022 ජූලි මස 21 දින දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගය මඟින් සංශෝධිත අංක 2289/07 සහ 2022 ජූලි මස 18 දින දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2022 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන සහ බලතල) නියෝග, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) 11 වන නියෝගයේ (1) වන ඡේදයේ "360ඇ යන වගන්තිය සහ 364, 365, 365අ, 365ආ යන වගන්ති සහ 427 සිට 446 දක්වා වන වගන්ති", යන වචන සහ ඉලක්කම් වෙනුවට "360ඇ, 364, 408 සහ 410 සිට 420 සහ 427 සිට 446 දක්වා වන වගන්ති" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) 12 වන නියෝගයේ (1) වන ඡේදයේ (ඉ) අනුඡේදයේ "360ඇ, 364, 365, 365අ, 365ආ වගන්ති යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "360ඇ, 364 වගන්ති යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

EOG 8 - 0046

1A - G 37181 — 366 (2022/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.